**කැලණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ටී.ආර්. ප්‍රේමතිලක මහතා සමඟ කළ සාකච්ඡාවකි**

# හෝර්ටන් තැන්නේ කළ පර්යේෂණයේ දී ලද අත්දැකීම්



හෝර්ටන් ප්‍රදේශයේ පැරණි පාරිසරික තත්ත්වය පිළිබඳව එහි අධ්‍යයන කටයුතු කළා. එය නිමා කළේ 1997 දී යි. පරාග විශ්ලේෂණය මගින් මේ අධ්‍යයන කටයුතු කළ හැකි බවට ප්‍රථම වතාවට ඔප්පු කර පෙන්වූයේ මෙම අධ්‍යයෙනුයි. ඉතාම දුෂ්කරතා මැදයි, මෙය ඉටුකර ගත හැකි වූයේ.



ටී. ආර්. ප්‍රේමතිලක මහතා

මූලික අධ්‍යාපනය ලැබුයේ දිවුලපිටිය මහා විද්‍යාලයෙන්. දැන් එය මධ්‍ය මහා විද්‍යාලයක්. උ.පෙළ සමත් වූයේ ද මේ පාසැලෙන්මයි. දැන් එය ශ්‍රී ඥානෝදය නම්නුයි හැඳින්වෙන්නේ. 'කැලණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කථිකාචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක මහතා ස්වකීය කටහඬ අවදි කළේ එලෙසිනි.

'මම ඉගෙන ගත්තෙ විද්‍යා විෂයන්. ඒ 1986 දී. ජීව විද්‍යාව, රසායන විද්‍යාව ආදිය, උ.පෙළ සමත්වෙලා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයටයි මම ඇතුල් වුනේ. ඒ 1987/88 වර්ෂවල. මේ කාලයේ දී ම වරකාපොල බහුතාක්ෂණික විද්‍යාලයේ සැලසුම් ශිල්පීය පාඨමාලාවක් හැදෑරුවා. 1992 දීයි විශ්ව විද්‍යාලයෙන් පිටවුනේ. විද්‍යාවේදී උපාධිය සමත් වූ පසු පශ්චාත් උපාධි ආයතනයට සම්බන්ධ වුනා. පර්යේෂණ සහකාර ලෙසින්. වි. විද්‍යාලයේ ඉගෙනගන්නා අතරතුරදීයි මෙයට සම්බන්ධ වුනේ. ඒ 1990 දී සීගිරිය, අනුරාධපුරය වැනි ස්ථානවල ක්ෂේත්‍රයේ වැඩ කිරීම ඇරඹුවා. වරින්වර අවු. 07 ක් පමණ එසේ සේවය කළා. මේවාට සම්බන්ධවී වැඩ කරන අතර මාස්ටර් උපාධියට (දර්ශනපති) ස්වීඩනයේ ස්ටොක්හෝම් විශ්ව විද්‍යාලයට ඇතුල් වුනා. ඒ 1994 වර්ෂයේ දී යි.

හෝර්ටන් ප්‍රදේශයේ පැරණි පාරිසරික තත්ත්වය පිළිබඳව එහි අධ්‍යයන කටයුතු කළා. එය නිමා කළේ 1997 දී යි. පරාග විශ්ලේෂණය මගින් මේ අධ්‍යයන කටයුතු කළ හැකි බවට ප්‍රථම වතාවට ඔප්පු කර පෙන්වූයේ මෙම අධ්‍යනයෙනුයි. ඉතාම දුෂ්කරතා මැදයි, මෙය ඉටුකර ගත හැකි වූයේ. ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලයෙනුත් ඒ සඳහා අනුග්‍රහය ලැබුණා. මෙවැනි අධ්‍යයන කටයුත්තක් ලංකාවේ කළ හැකි කමක් තිබුණේ නෑ. මෙය ලංකාවේදී කළ නොහැකි බැව් සමහරුන්ගේ මතය වුණා. අවු. 02 ක් තිස්සේ අපමණ දුෂ්කරතාවලට මැදිවෙමිනුයි මෙය කළේ. එසේ එය කෙසේ හෝ ඉටු කර ගැනීමෙන් එය කළ හැකි දෙයක් බම මා ඔප්පු කර පෙන්වූවා. මේ සඳහා මූලික අනුග්‍රහය ලබා දුන්නේ මහාචාර්ය සේනක බණ්ඩාරනායක සහ ආචාර්ය සෙනෙවි එපිටවත්ත, සිරිනිමල් ලක්දුසිංහ යන මහත්වරුයි. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිරාන් දැරණියගල මහතාත් මේ සඳහා මා උනන්දු කළා. අනෙක් සියළුදෙනාගේම මතය වූයේ මෙය අල්ලා දැමිය යුතු බවයි. එහෙත් ඒ සඳහා විද්‍යාගාරය දියුණු කර දුන්නේ සේනක බණ්ඩාරනායක මහතායි. අවු. 04 ක් තිස්සේ බොහෝ දුෂ්කරතා මැද අපමණ වෙහෙස විඳිමිනුයි මෙය කළේ. මෙම මාස්ටර් උපාධිය කළ පසුවයි කවුරුත් පිළිගත්තේ මෙය කරන්න පුළුවන් කියා.

මෙවැනි අධ්‍යයන කටයුතු මෙහි කිරීම ඉතාම වැදගත් වෙයි. ඉතිහාසය විෂය විද්‍යාව හා සම්බන්ධ දෙයක් බවත් එය ගොඩනැගිය යුත්තේ විද්‍යාව ආශ්‍රයෙන් බවත් මෙවැනි අධ්‍යයන මෙහි කළහැකි බවත් කළ යුතු බවත් ප්‍රථම වරට ප්‍රකාශ කළේ ආචාර්ය සිරාන් දැරණියගල මහතා ය.ඔහුගේ එම ප්‍රකාශය මෙම අධ්‍යයන කටයුතු සඳහා විශාල පිටුබලයක් විය. මෙවැනි අධ්‍යයන කටයුතු මෙහි කළ නොහැකි බව බොහෝ දෙනකු ප්‍රකාශ කළ නමුත් එය කළ හැකි බව එකහෙලා ඔහු ප්‍රකාශ කිරීම ද මෙම අධ්‍යයනයන් කිරීමට දුන් ධෛර්යයක් විය.

"මෙම අධ්‍යයන කටයුතුවලට

අදාළ පුහුණුවීම් කටයුතු කළේ ඉන්දියාව, රුසියාව, ස්වීඩනය වැනි රටවලට ගොසිනුයි. ඒ සඳහා මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතාගේ අනුග්‍රහය ලැබුණා. ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලයේ භූගර්භ විද්‍යා පර්යේෂණ ආයතනයේ ලංකාවේ පුරාතන පරිසරය සහ එහි වෙනස්වීම් පිළිබඳ ඈත අතීතයේ අධ්‍යයනය කිරීම පිළිබඳ පුළුල් වැඩසටහනක් ආරම්භ කළා. එය සිදුකළේ 1995 දී යි. මේ අධ්‍යයන කටයුතු පිළිබඳව 1998/99 කාලයේ දී මූලික කටයුතු ආරම්භ කළා. ස්ටොක්හෝම් විශ්ව විද්‍යාලයේ චාතුර්තක භූගර්භ විද්‍යා අංශයේ පර්යේෂණ ආයතනය සමග පුළුල් පරීක්ෂණ ආරම්භ කළා. කොටොහරි රිසර්ච් ඉන්ස්ටියුට් ස්වීඩනයේ උත්සලා විශ්වවිද්‍යාලයත් මෙම අධ්‍යයනයට සම්බන්ධ වුනා. පුරාණ ඉතිහාසය සහ පුරාවිද්‍යාව යන අංශ (උත්සලා වි. විද්‍යාලය) මෙයට මූල්‍ය ආධාර ලබා දුන්නේ සීඩා ආයතනයෙනුයි. ඊට අමතරව ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා කවුන්සිලය(NRC)මගින් ද මූල්‍ය ආධාර ලැබුණා. මෙය දිගටම කරගෙන යෑම සඳහා අවු 04 ක ශිෂ්‍යත්වයක් ලැබුණා. ආචාර්ය උපාධි කටයුතු සඳහා එය ලැබුණේ. දැනට මෙම අධ්‍යයනයේ අවු. 03 ක් අවසන් වෙලා තිබෙනවා. පසුගාමීතාවක් යටතේ වුවද කීප දෙනෙකුගෙන් ලැබුණු සහාය ඉමහත් බව ද ඔහු සඳහන් කළා. ඒ අතර මහාචාර්ය සේනක බණ්ඩාරනායක, ආචාර්ය සෙනෙවි එපිටවත්ත, සිරිනිමල් ලක්දුසිංහ සහ PGIAR සහෝදර ආචාර්ය මණ්ඩලයේ සෙසු සියලුම දෙනා අයත් වෙති.



කෝටි වාරයක් විශාල කළ පරාග කණිකාවක්

ලංකාවේ ඉතිහාසය සහ විද්‍යාව යන දෙක ඇත්තේ අංශ දෙකක. විද්‍යාව ඉගෙන ගන්න අය එක පැත්තක, සමාජ විද්‍යාව, ඉතිහාසය ඉගෙන ගන්නා අය තවත් පැත්තක. ඒ දෙගොල්ලන් එකතුවී වැඩ කරන එක දකිය හැක්කේ කලාතුරකින්. එබැවින් මේ පිළිබඳ සාර්ථකව අධ්‍යයන කටයුතු කිරීමට කළ නොහැකි වෙලා තිබෙනවා. රටක ඉතිහාසය ඉතා වැදගත්. ලෝකයේ අතීත් රටවල ඉතිහාසය යන විෂය හැමදෙනෙක් විසින්ම අධ්‍යයනය කළ යුතුයි. ඒත් ලංකාවෙ තත්ත්වය ඊට වෙනස්. කැමති කෙනෙකුට එය හැදෑරිය හැකියි. කැමැති නැත්නම් නිකං ඉන්නත් පුළුවන්. ඉගෙන ගන්නත් එය වැඩක් ඇති විෂයක් ලෙස අපේ රටේ අධ්‍යාපන ක්‍රමය එය පිළිගන්නෙ නෑ. මේ නිසා අපේ මුතුන් මිත්තන් ගැන, අපේ අතීතය ගැන අලුත් පරම්පරාවට දැන ගැනීමට මේ අධ්‍යාපන ක්‍රමය තුළ සැලැස්මක් නෑ. මේ නිසා වර්තමානයේ විශාල අර්බුදයකට හේතුවක් වෙලා තියෙනවා. එය සිරවී ඇත්තේ ජනවාර්ගික අර්බුදයත් තුළ. අපේ අතීතය ගොඩනැගීමට මුතුන් මිත්තන් ඒකරාශී වී බොහෝ වෙහෙස මහන්සි වී තිබෙනවා. එය සොයා බැලීමට විද්‍යාව උපයෝගී කරගත යුතු වෙනවා. අපේ රටේ විද්‍යාත්මක දියුණුවක් තිබෙනවා. ඒ පිළිබඳව මිනිසුන් එකතු කර යමක් කිරීම අද අපහසු කරුණක් වී තිබෙනවා. මේ පිළිබඳ වි. විද්‍යාලවල විශේෂඥයින් සහ ගුරුවරු නොසිටීම විශාල අඩුවක්. වි. විද්‍යාලවලින් තැනක් දුන්නේ සීමිත විෂය ධාරාවන්ට පමණි. බොහෝ විෂය ධාරාවන් කප්පාදු කොට වැලලී යන්නට සැලැස්සුවා. එසේ යටපත් කළ විෂයයන් අතර ඉතිහාසය එක දෙයක්.



ප්‍රේමතිලක මහතා පර්යේෂණ කටයුතු මෙහෙයවමින්

අඟුරු භාවිත කිරීමෙන් විතරක්ම කාල නිර්ණය කළයුතු බව සමහරු කියනවා. නමුත් අද අඟුරු භාවිත කිරීම අනුව විතරක් නෙවෙයි ගල් අඟුරු සෑදීමට පෙර හැඳින්වෙන පීට් පිළිබඳව අපි අවුරුදු දෙක විතර කාලයක් පර්යේෂණ කළා 1993 විතර. ඒ පීට්වල අවුල් සහගත නැති පීට් තැම්පතු ඇති තැන් සොයා ගත්තා. එම පීට් තියැදි විවිධ ගැඹුරු ප්‍රමාණ වලින් ලබා ගත්තා. මේ පීට්වල තියෙන උත්සලා විශ්ව විද්‍යාලයේ දී තමයි මේ පිළිබඳව පර්යේෂණ කළේ. එක සාම්පලයකට දින නියම කිරීමේ කටයුතු වලට රු. 75,000 පමණ වියදම් වෙනවා. එවැනි දින නියමයන් සාම්පල 25 විතර පර්යේෂණ කළා.

**ප්‍රශ්නය** :- පීට් (PEAT)යනු මොනවාද?

**පිළිතුර** :- වසර දහස් ගණනාවක් තිස්සේ පැලෑටි ශාක කොටස් දිරාපත්වීම සමග ඇතිවන තැම්පත්වී තිබීම නිසා, විශාල ඒවා තමයි මේ පීට් බවට පත්වන්නේ. දින වකවානු සඳහා කාබන් 14 ක්‍රමය අනුව තමයි මේ පිළිබඳව සොයා බැලුවේ. ඒ ක්‍රමයට A.M.S Dating කියල කියනවා.

ATOMIC MASS SPECTROSCOPY පීට්වලින් ගන්නා පරමාණුවක් අරගෙන එක මිලිග්‍රෑම් එකක් පමණ භාවිත කරනවා. කොන්වෙන්ෂනල් ඩේටින් ක්‍රමය අනුව ග්‍රෑම් 200 පමණ මේවා ගන්නවා. නිරපේක්ෂ කාල නිර්ණය වශයෙන් පරාග විශ්ලේෂණ කිරීමත් සිදු කර තියෙනවා.

**ප්‍රශ්නය** :- මේ වගේ දින වකවානු ක්‍රම කීපයක් අනුව නිරපේක්ෂ හා සාපේක්ෂ කාල නිර්ණ ක්‍රම අනුව කොපමණ කාලයක් පැරණිද මේ ප්‍රදේශය?

**පිළිතුර** :- ඈ තම දින වකවානුව අවුරුදු 20,000 ක් පමණ පැරණි බව පර්යේෂණවලින් හෙළිවී තියෙනවා.

**ප්‍රශ්නය** :- මේ පර්යේෂණ සඳහා පීට් ලබා ගත්තේ හෝර්ටන් තැන්නේ කොපමණ ගැඹුරකින් ද?

**පිළිතුර** :- අප මේ පර්යේෂණ සඳහා හෝටන් තැන්නේ ඇති වගුරුමය බිම්වල මීටර් 6 ක් විතර යටින් තමයි මේ පීට් ලබා ගත්තේ පර්යේෂණ සඳහා. ඒ පීට්වල තැම්පත් වී තිබුණු පරාග පොසිල තමයි මේ පර්යේෂණවලට යොදගත්තේ.

**ප්‍රශ්නය** :- පරාග කියන්නේ මොනවා ද?

**පිළිතුර** :- මල් රේණු අග තියෙනවා පරාග. පරාගධානි තුළ තමයි පරාග තියෙන්නේ. ඉතින් මේ පරාග ස්ත්‍රී පරාග හා පුරුෂ පරාග සංයෝගවීමේ දී ඒ පරාග විශාල ප්‍රමාණයක් ඉවතට වැටෙනවා. මේ පරාග ජලයේ හෝ පස්මත අවුරුදු දහස් ගණනක් තිස්සේ විනාශ නොවී තියෙනවා. පොළවට වැටුණු පරාග කාලයක් ගිය විට පොසිල බවට පත් වෙනවා.




**විශාලනය කළ පරාග**

අතීතය විස්තර කළ හැකි ශාක හෝ සත්ත්ව අවශේෂ පාෂාණීභූත වූ අවස්ථාවක් ලෙසින් සඳහන් කළ හැකිය. මේ අතර සලකුණු ද ලකුණක් ද පා සටහනක් උණත් පොසිල වශයෙන් විය හැකියි.

මේ පරාග පොසිල බවට පත් උනාම ඒවායේ ඇති රසායනික සංයුතියත් ආරක්ෂාවී තිබෙනවා. SPERO POLYLININEරසායනිකය නිසා ආරක්ෂා වී තියෙනවා. මඩ ගොහොරුවල රැඳී තියෙනවා.

මේ පරාග ගසින් ගසට වෙනස් පැලෑටිවල ආවේණික ලක්ෂණ මේ පරාග වලින් සොයා ගත හැකි ය. අද පරාග විශ්ලේශන විද්‍යාව යනු කුමක් ද?

ස්කැන්ඩිනේවියානු රටවල 1923 පටන් ගන්නා ස්විඩනයේ හිටපු වැන්පෝස්ට් මහතා තමයි පටන් ගත්තේ පීට් නිධිවල පරාග විශ්ලේශනය කිරීම. ස්කැන්ඩිනේවියානු රටවල ආරම්භ වී මෙය ලොව පුරා ව්‍යාප්ත වෙලා ගියා. යුරෝපීය රටවල අද ප්‍රබල තාක්ෂණික මෙවලමක් විදිහට භාවිත කරනවා අතීතය සොයා බැලීමට මේවා පියවි ඇසට පෙනෙන්නේ නෑ. ඒ සඳහා මයික්‍රස්කෝප් (අන්වීක්ෂය) අපේ පර්යේෂණාගාරයේ ඇත. ඉතා දියුණු අධිබලැති අන්වීක්ෂ (Electrom microslope)මේ තියැදි ලබාගන්නා ක්‍රමය කුමක් ද?

1. ජැක් හැමර් ක්‍රමය (Jack hammer)

2. රසියන් කෝරා මැෂිම මගින් මේ පීට් ලබා ගන්නවා. ඒ තියැදි පස් විද්‍යාගාර තුළට ගෙන ඒවායේ කුඩා සාම්පල් අර ගෙන සියලුම මඩ වැලි ඉවත් කර පරාග විතරක් ලබා ගන්නවා. ඒ පරාග ලබා ගැනීමට දින 2 ක් පමණක් ගතවෙනවා. අම්ලවර්ග භාවිත කිරීමෙන් තමයි පරාග ලබා ගන්නේ. අන්වීක්ෂවලින් පර්යේෂණ කරනවා. ඒ අධිබලැති අන්වීක්ෂණ ස්කෑ ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂ මගින් ද පැලෑටි වර්ග හඳුනාගත හැකිය. පොසිල මගින් පැලෑටි වර්ග තේරුම් ගත හැකි ය. පැලෑටි මගින් සොබාදහම තේරුම්ගත හැකිය. ඒ සොබාදහම තුළ මිනිසා කෙසේ ක්‍රියා කර තිබේද කියා සෙවිය හැකියි. කොටින්ම මිනිසා තේරුම් ගැනීමට පුළුවනි.

සොබාවිකව සොබාදහමේ ක්‍රියාකාරම් ද විස්තර කරන්ට පුළුවනි පැලෑටි මගින්. පොසිල මගින් පැලෑටි වර්ග තේරුම් ගන්නවා. පොසිල බවට පත්වී ඇත්තේ කුමන තත්ත්වයන් යටතේ ද කියා අපට දැනගත හැකියි. ආරක්ෂා වී නැති අවස්ථා ද තියෙනවා. ඊට හේතු මොනවද කියලත් සොයා බැලිය හැකිය. ඒ අනුව අපට මේ විද්‍යාත්මක ක්‍රමයන් මගින් අතීතය විග්‍රහ කරන්නට පුළුවනි.

**ප්‍රශ්නය** - මේ ක්‍රමය මගින් සොයාගත් දේ මොනවා ද?

**පිළිතුර** - ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය ආරම්භය අවුරුදු 14,000 පෙර දී ය. අවුරුදු 9000 පමණ පෙර තියම කෘෂිකර්මාන්තයත් ආරම්භ වී තියෙනවා. ලෝක මට්ටමින් කථා කිරීමේදී ගල් යුගයෙන් ක්‍රමයෙන් ඈත් වී වඩාත් ශිෂ්ටාචාරවත් මිනිසාගේ කටයුතු දැක ගත හැකිව ඇත්තේ අදින් වසර 10,000 පමණ පෙරයි. ඒ සිරියාව, ජෝර්දනය, පලස්තීනය ආදී ප්‍රදේශවලයි. මෙසේ මිනිසා ශිෂ්ටාචාරවීමට බලපෑ ප්‍රධානතම හේතුව ඔවුන් කෘෂිකාර්මික ජීවිතයකට එළඹීමයි. සතුන් ශාක හීලෑ කර ගනිමින් (බාර්ලි, යව, වී, මෙනේරි, හරකා, එළුවා) තමයි කෘෂිකාර්මික විප්ලවය ලෝකයේ මුලින් ම ඇතිවුනේ. ඉතින් මේවාට සමගාමීව ශ්‍රී ලංකාවේ දැන් සොයා ගෙන ඇති තත්ත්වයද අතිශය වැදගත් ය. කෘෂිකර්මාන්තයට පෙර සිටි කාලය ගැන මොනවද පර්යේෂණ මගින් සොයාගෙන තියෙන්නේ.



**පශ්චාත් පුරා විද්‍යා අධ්‍යයන ආයතනයේ විද්‍යාගාරයේ පර්යේෂණ සහායක අසෝක පෙරේරා**



ප්‍රේමතිලක මහතා විද්‍යාගාරය තුළ පර්යේෂණ සිදුකරමින්....

මිනිසුන් කෘෂිකර්මාන්තයට පෙර හන්ටින් ගැදරිං (Hanting and gathering)දඩයමින් හා ද්‍රව්‍ය එකතු කරමින් තැනින් තැන යන ස්වරූපයක් තිබුණා. ඒ කාලයට පසුව තමයි මිනිසුන් කෘෂිකර්මාන්තය පටන් ගත්තේ. වසර 14 000 පෙර ඒ තත්ත්වය මේ පර්යේෂණ මගින් හෙළිවී තියෙනවා.

හොලෝසීන යුගයේ වසර 10,000 පෙර තමයි ලෝකයේ කෘෂිකර්මාන්තය ආරම්භ වී තියෙන්නේ ශාක සහ සතුන් හීලෑ කිරීමත් ඒ කාලයේදී ඇති වුණා. ජෝර්දාන්, තුර්කිය, ජෙරුසෙලම්, පලස්තීන ආදිය ප්‍රදේශවල කෘෂිකර්මය ආරම්භ වුණා. ශිෂ්ටාචාරයන් බිහිවුනේ, මෙසපොතේමියානු යුප්‍රටීස්, ටයිග්‍රීස්වල ලොව මුල්ම ශිෂ්ටාචාර ඇති වුනා. චීනයේ වී වගාව වසර 11,000 පෙර සිදු කර ඇති බව චීනයේ පර්යේෂණවලින් ද සොයා ගෙන තියෙනවා.

ක්‍රි. පූ. 7000 වාගේ කාලේ කෘෂිකර්මාන්තය ආසියානු කලාපයේ පටන් ගෙන තියෙනවා. ලංකාවේ ද බාර්ලි යව වැනි පැළෑටි වගා කර ඇති බව නවතම පර්යේෂණ වලින් සොයාගෙන ඇත්තේ කෘෂිකර්මය වසර 9000 පෙර තිබුණු බව ය.

මධ්‍ය ශිලා යුගයේ සිටි මිනිසුන් ක්‍රි. ව. 14 000 සිට 9000 දක්වා සංක්‍රමණික අවස්ථාවකයි පසු වෙලා තියෙන්නේ. ඒ කියන්නේ කෘෂිකර්මය ම නියත වශයෙන් ම ගෙනගිය බවයි. මෙය අපි හඳුන්වන්නේ Prefarmic Cultureතමිනුයි.

**ප්‍රශ්නය** :- ඔබේ මේ අධ්‍යයන සඳහා ඔබට උපකාර කළ අය පිළිබඳව සඳහන් කරතොත් කොහොමද?

**පිළිතුර** :- මේ සඳහා මූලිකවම මා ඉහතින් විස්තර කරපු ලංකාවේ විද්වතුන්ට අමතරව මහාචාර්ය ජැන් රිස්බර්ග්, මහාචාර්ය උර් මිලර් යන දෙදෙනා විශේෂයෙන් ම සඳහන් කළ හැකියි.

විශේෂයෙන් ම මේ කටයුතුවලදී ඒ සඳහා දුන් ඉන්දියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් ඒ කාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතාගේ උපකාරය ලැබුණා. ඔහුගේ විශේෂ අනුග්‍රහය ලැබුණා. ඊට අමතරව මහාචාර්ය කොවුර් මහතාගෙන් ලැබුණ සහයෝගය ද විශේෂයි.

තවත් සඳහන් කළයුතු දෙයක් තමයි මගේ පර්යේෂණ කටයුතුවලදී අසෝක පෙරේරා මහතා විද්‍යාගාරයේ දී (ලංකාවේ) මේ පර්යේෂණ කටයුතුවලදී සහායවීම ඊට අමතරව මේ ඡායාරූප ගැනීමේ කටයුතු මදනායක මහතාගේ පූර්ණ සහාය ලැබී තියෙනවා. ඒ විතරක් නෙවෙයි දැනට මේ පශ්චාත් පුරාවිද්‍යා අධ්‍යයන ආයතනයේ කැලණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ වර්තමාන අධ්‍යක්ෂ සිරිනිමල් ලක්දුසිංහ මහතා ඇතුළු සහෝදර කාර්ය මණ්ඩලය මෙම ආයතනයේ සියලුම දෙනාගෙන් ද මට මේ පර්යේෂණය සඳහා ලැබුණු සහයෝගය පිළිබඳව මගේ කෘතඥතාව පළ කිරීමට කැමතියි. මගේ ගමන් බිමන්වලදී නිතර මා සමග ගිය රියැදුරු මහින්ද පෙරේරා, අයි.එස්. සරත් යන මහත්වරුන් මේ වැඩ වලදී මට ලබා දුන් සහාය අගය කරනවා.

ක්‍රි. පූ. 7000 වාගේ කාලේ කෘෂිකර්මාන්තය ආසියානු කලාපයේ පටන් ගෙන තියෙනවා. ලංකාවේ ද බාර්ලි යව වැනි පැළෑටි වගා කර ඇති බව නවතම පර්යේෂණ වලින් සොයාගෙන ඇත්තේ කෘෂිකර්මය වසර 9000 පෙර තිබුණු බව ය. මධ්‍ය ශිලා යුගයේ සිටි මිනිසුන් ක්‍රි. ව. 14 000 සිට 9000 දක්වා සංක්‍රමණික අවස්ථාවකයි පසු වෙලා තියෙන්නේ.

අවසාන වශයෙන් සඳහන් කළ යුතු දෙයක් නම් මේ කටයුතු මගේ තනි උත්සාහයක් නෙවෙයි. මේවා සියල්ලම අප කණ්ඩායම් කාර්යයක් ලෙසයි මම සලකන්නේ. එසේ අනාගතයේදීත් මීට වඩා අප රටේ විද්‍යාත්මක හා පර්යේෂණ කටයුතුවලදී එකට එක්වී වැඩ කිරීමේ ක්‍රමයක් අප තුළ ඇති කර ගැනීම ඉතාම වැදගත්. මේ තත්ත්වය අද දියුණු රටවල දකින්න ලැබෙනවා. අපේ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික අධ්‍යයන කටයුතුවලට විද්‍යාත්මක පර්යේෂණ යොදා ගැනීම ඉතාමත් අවශ්‍යයි. මේ බව මීට ඉහත දී කිප අවස්ථාවකදීම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිරාන් දැරණියගල මහතා ද ප්‍රකාශ කරල තියෙනවා. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිරාන් දැරණියගල මහතා මෙවැනි පර්යේෂණ අනාගතයේදී ලංකාවේ සිදු කළ හැකි බව ප්‍රථම වතාවට සඳහන් කළා විතරක් නෙමෙයි මේ මගේ පර්යේෂණ පිළිබඳව ආචාර්ය දැරණියගල මහතා ලබා දුන් සහයෝගය ද මෙහිදී මා කෘතවේදීව සිහිපත් කළ යුතු ය. ❑



දහස්වරක් විශාල කළ පොසිල පරාග කණිකාවක්